කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

**සමාජීය විද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය** (නව/පැරණි නිර්දේශය)

## භාෂාව හා සන්නිවේදනය MACO – E 2015

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. ''මානව භාෂාවේ ප්‍රභවය හා පරිණාමය සිදු වූයේ පාරිසරික අත්දැකීම් හා අවශ්‍යතා මතය'' විමසන්න. (ලකුණු - 20)

2. ''භාෂාවේ කාර්යයභාරය තොරතුරු සම්ප්‍රේෂණයට පමණක් සීමා නොවූවකි.'' පැහැදිලි කරන්න. (ලකුණු - 20)

3. ''භාෂාව මගින් සංස්කෘතික සම්ප්‍රදායන්හි විවිධත්වය හා එහි පැතිරීම පිළිබිඹු කරයි.'' නිදසුන් සහිතව පෙන්වාදෙන්න. (ලකුණු - 20)

4. පුවත්පත් මාධ්‍ය තුළ භාෂා භාවිතයේ විවිධත්වයන් නිරූපණය වන ආකාරය නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු - 20)

5. ''ශ්‍රාවකයා තුළ අපූර්වත්වයෙන් යුතු හැඟීම් උත්පාදනයෙහි ලා ශබ්දය සතු ශක්‍යතාව පුළුල් වූවකි.'' ගුවන්විදුලි මාධ්‍යයට විශේෂිතව විමසන්න. (ලකුණු - 20)

6. සංඥාර්ථවේදය පිළිබඳ කෙටි හැඳින්වීමක් කර නිර්මාණ රසවිඳීමේදී එහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු - 20)

7. සාහිත්‍ය භාෂාවේ නිර්මාණාත්මක ලක්ෂණ පිළිබඳව නූතන සාහිත්‍ය නිර්මාණකරුවන් තිදෙනෙකුගේවත් නිර්මාණ ඇසුරෙන් විවරණය කරන්න. (ලකුණු - 20)

8. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න.

   i. සමාජ අවස්ථා හා භාෂා භාවිතය
   ii. සන්නිවේදනයේ ජනවහරේ වැදගත්කම
   iii. රූපවාහිනී වෙළඳදැන්වීම් හා රූප භාෂාව
   iv. ප්‍රාදේශීය ව්‍යවහාර බිහිවීමෙහිලා බලපාන සාධක
   v. නව මාධ්‍ය හා භාෂා භාවිතය (ලකුණු - 20)

****************************************